# සාහිත්‍යකරණය හා ධනාත්මක චින්තනය




නිර්මාණ කෘතියකින් මූලික වශයෙන් අපේක්ෂිත රස වින්දන කාර්යයට අමතරව සාහිත්‍යය මගින් ඉටු කළ හැකි හා ඉටු විය යුතු වෙනත් අරමුණු බොහෝය. ඒ අතුරෙන්, සාහිත්‍ය කෘතියක් කියවන පාඨකයා තුළ ධනාත්මක චින්තනය වර්ධනය කරවීම ද වැදගත් වූවකි. මෙලොව උපත ලබන කවර හෝ පුද්ගලයකු නිරතුරුවම ප්‍රාර්ථනා කරනු ඇත්තේ යහපත් වූ ද, සාර්ථක වූ ද ජීවිතයක් ගත කිරීමටය. ඒ සඳහා විවිධ අපේක්ෂාවන් එම පුද්ගලයාගේ සිත තුළ ජනිත වනු ඇත. එවන් අනේකවිධ බලාපොරොත්තු සාක්ෂාත් කරගැනීමට ඉවහල් කරගත හැකි මාධ්‍ය අතර පොතපත කියවීම, විශේෂයෙන්ම සාහිත්‍ය නිර්මාණ කියවීම හා රස වින්දනය වැදගත් තැනක් ගනී. සාහිත්‍ය නිර්මාණයෙහි නියැළෙන ලේඛකයා හෝ ලේඛිකාව එම කරුණ ද සිත තබාගත යුතු වන්නේ උක්ත පරමාර්ථය ඉටු කරගැනීමට පාඨකයාට සහාය වීමක් ද ලෙසිනි.

බුදු දහමෙන් මූලික වශයෙන් ඉගැන්වෙන ධනාත්මක චින්තන සංකල්පය අද වන විට ලෝකයේ බොහෝ රටවල ජනප්‍රිය සංකල්පයක් බවට පත් වී ඇත. නිදසුනක් ලෙස ජපන් සමාජය ගෙන බලන විට එරට ජනතාවගේ ව්‍යවහාරයේ ප්‍රචලිතව පවතින යෙදුම් දෙකක් ලෙස " ගම්බත්තෙ කුදසායි" සහ "ගම්බරිමස්" ගත හැකිය. කිසියම් හේතුවක් නිසා කෙනකු ඉච්ඡා භංගත්වයට පත්ව සිටින අවස්ථාවකදී ඔහුට හෝ ඇයට හිතවත් කෙනකු "ගම්බත්තෙ කුදසායි" යනුවෙන් පවසන්නේ "කරුණාකර උත්සාහ ගන්න" යන අරුතෙනි. "සිදු වී ඇති දෙය ගැන කම්පා නොවී, එයින් පසුබට නොවෙමින් යළිත් උත්සාහ ගන්න" යන දයාන්විත ඉල්ලීම එහි අන්තර්ගත වෙයි. එයට සවන් දෙන අදාළ පුද්ගලයා, " ගම්බරිමස්" යනුවෙන් පවසනු ඇත්තේ, "ඔව්, මම උත්සාහ ගත යුතු වෙමි." යන ප්‍රතිචාරය දක්වමිනි. එනම්, තමන් 'අසාර්ථක වූ දෙය සාර්ථක කරගැනීමට නැවතත් දිරිමත් වෙමි' යන අදහස සමග සිය අධිෂ්ඨානශීලී බව ද ප්‍රකාශ කරමිනි. සිංහල සමාජයේ එදා පටන්ම ප්‍රචලිතව පවතින, " උත්සාහවන්තයා ජය ගනී" වැනි ප්‍රස්තාව පිරුළු මගින් වුව ද ප්‍රකට වන්නේ මෙම ආකල්පමය. වෙනත් බොහෝ සමාජවල ද ජනතාව මේ ආකාරයේ සාධනීය ආකල්ප මගින් සිය ජනතාව දිරිමත්ව ඉදිරියට ගෙන යාම අපේක්ෂා කරන බව නොරහසකි.

සාහිත්‍ය කරුවා ද සිය නිර්මාණ මගින් පාඨක සමාජයට ජීවිතය හා මනුෂ්‍යත්වය ගැන කියා පායි. ඒ සමගම, සමස්තයක් වශයෙන් ගත් කල කිසියම් යහපත් පණිවුඩයක් ගෙන ඒම ද ඔහුගේ අපේක්ෂාව වනු ඇත. ජීවිතය තුළ මිනිසා විඳින දුක සැප මෙන්ම එම විවිධ අවස්ථාවන්ට ඔවුන් මුහුණ දෙන ආකාරය ද බොහෝ විට ඒවායෙහි ඇති සංකීර්ණ ස්වරූපය ද විදහා පාමින් විවරණය කිරීම ලේඛක ලේඛකාවන් අතින් සිදු වන්නකි. විශේෂයෙන්ම නවකතාකරණයෙහි නියැළෙන්නන් සිය කෘතීන් මගින් ජීවිතයේ යහපත් පැත්ත මෙන්ම අයහපත් පැත්ත ද විවරණය කිරීමට යොමු වීම සාමාන්‍යයෙන් දැකගත හැකි තත්වයයි. එසේ වුවද සිය නිර්මාණය මගින් කිසියම් චරිතයක් මුහුණ දෙන සාධනීය අත්දැකීම් ඉස්මතු වන සේ සිදුවීම් ගළපමින් කථා සන්දර්භය ගොඩනැංවීමට යොමු වන නවකතාකරුවන් ද බොහෝ විට අපට හමු වන බව කිව යුතුය. විශ්ව සාහිත්‍යය විමසා බලන විට චාල්ස් ඩිකන්ස් වැනි සුප්‍රකට ලේඛකයන් ඇතැම් යෞවන චරිත, ජීවිතයේ විවිධ බාධක ජයගනිමින් ඉදිරියට යන ආකාරය පිළිබිඹු කරමින් නවකතා රචනා කර ඇති බව ප්‍රකට කරුණකි. සිංහල සාහිත්‍යයේ ප්‍රදීප ස්තම්භයක් බඳු මාර්ටින් වික්‍රමසිංහ මහතා අතින් ලියවුණ, 'මඩොල් දූව' වැනි නවකතාවක් කියවන පාඨකයා ද ලබන අත්දැකීම් මේ හා සමානය. තම මෑණියන්ගේ අභාවයෙන් පසු සිය පවුල තුළදීම මනසින් හුදකලා බවට පත් වන උපාලි වයසින් වැඩෙද්දී දඟකාර මෙන්ම පෙරළිකාර වූ ද චරිතයක් වෙයි. ජින්නා නමැති තම ගැමි යහළුවා ද සමග, හොරෙන් නිවසින් පැන යන උපාලි විටින් විට, තැනින් තැනදී විවිධ අභියෝගයන්ට මුහුණ දෙමින් අවසානයේදී සාර්ථක චරිතයක් බවට පත් වන අයුරු මාර්ටින් වික්‍රමසිංහ මහතා එකල පාඨකයන් වෙතට ගෙන ආ එම යෞවන නවකතාවෙන් මැනවින් නිරූපණය කර ඇත. සිංහල නවකතාවේ මුල් අවධිවල රචනා වූ බොහෝ කෘතීන්හි ද අන්තර්ගත චරිත අනේකවිධ බාධක ජයගනිමින් අවසානයේදී සිය අරමුණු සාක්ෂාත් කරගන්නා ආකාරය දක්වා ඇත.

කෙසේ නමුදු සිංහල නවකතාව වඩවඩාත් වර්ධනය වෙමින් ඉදිරියට ගමන් කර ඇති මාර්ගය දෙස බලන විට නවකතාවකින් විය යුතු ජීවිත විවරණය හා චිත්ත විවරණය තව දුරටත් සංකීර්ණ ආකාරයෙන් සිදු කරන්නට ලේඛක ලේඛිකාවන් යොමු වී ඇති ආකාරය පැහැදිලිය. විශේෂයෙන්ම තරුණ කථා නායක නායිකාවන් මුඛ්‍ය චරිත ලෙස යොදා ගැනුණ නවකතාවලදී ඔවුන්ගේ ජීවන ප්‍රශ්න, ලිංගික ජීවිතය පිළිබඳ විවිධාකාර ගැටලු හා ඒවායින් රෝගී බවට පත් වන සිත් සතන් ගැඹුරින් විවරණය කරන්නට බොහෝ කතුවරු යොමු වූහ. පේරාදෙණි සාහිත්‍ය අවදිය තුළදී ගුණදාස අමරසේකර, සිරි ගුනසිංහ වැනි ලේඛකයන් කළ අත්හදාබැලීම්වලදී ද එවන් සංකීර්ණ ජීවන ප්‍රශ්න හමුවේ පරාජිත තත්වයට පත් වන චරිත ඔවුන්ගේ නවකතාවලට ඇතුළත් වීම විශේෂයෙන් කැපී පෙනුණි. හෙවනැල්ල, යළි උපන්නෙමි, කරුමක්කාරයෝ බඳු නවකතා එකල පාඨක සමාජය තුළ ආන්දෝලනයක් ඇති කරන්නට සමත් වූයේ ද මෙම විශේෂත්වය හේතු කොටගෙනය.

සිංහල නවකතාව තවත් වසර ගණනක් ගත කරමින් තිබියදී, විශේෂයෙන්ම ලේඛිකාවන් අතින් රචනා වූ නවකතාවල කාන්තා චරිත නිරූපණය වන්නට වූයේ දැඩි සමාජ අසාධාරණකම්වලට මුහුණ දුන් ගැහැනුන් ලෙසිනි. විශේෂයෙන්ම ලිංගික සූරාකෑම්වලට හසු වෙමින් ජීවිතය කරදරකාරී ලෙස ගෙවූ කාන්තා චරිත සුමිත්‍රා රාහුබද්ධ වැනි ලේඛිකාවන්ගේ නිර්මාණවලට විෂය විය. සාහිත්‍යය යනු ජීවන යථාර්ථය මෙන්ම සමාජ යථාර්ථය ද පිළිබිඹු කරන්නක් ලෙස නිවැරදිව හඳුන්වා දිය හැකිය. ඒ අනුව උක්ත නිර්මාණකරුවන් තම නවකතාවලට වස්තු විෂය තෝරාගැනීමේදී සමාජය තුළ සිදු වෙමින් පැවති හා තවදුරටත් සිදු වෙමින් පවතින කාන්තා හිංසනය, ලිංගික සූරාකෑම් ආදී ගැටලු හා අභියෝග වඩාත් පුළුල් ලෙස විග්‍රහයට ලක් කිරීමට යොමු වූ බව දැකගත හැකිය.

සමාජයක් තුළ නිරන්තරයෙන්ම සිදු වනුයේ අසාධාරණකම් පමණක් ද යන්න ලේඛක පාඨක කවුරුන් හට වුවද මතු විය හැකි ප්‍රශ්නයකි. පැහැදිලි අරමුණකින් යුතුව ජීවිත ගමන අරඹන තරුණ තරුණියන්ට ජීවිතය පුරාම බාධක, කම්කටොලුම හමු වේ යයි කීම අතිශයෝක්තියකි. එමෙන්ම කවර පුද්ගලයකුට හෝ මුළු දිවිය පුරාම කිසිදු අභියෝගයක් නොමැති, ගල් පරවලින් තොර යහපත් මාර්ගයකම ගමන් කරන්නට හැකි වේය යන්න ද යම් තරමකට සුරංගනා කතාවකට සමාන විය හැකිය. එබැවින් කවර නිර්මාණ කෘතියකින් වුව ජීවිතයේ දුක සැප, ජය පරාජය ආදී අටලෝ දහමේ එක් එක් අවස්ථාවලට මුහුණ පාන සංකීර්ණ චරිත නිරූපණය වීම අවශ්‍ය වනු ඇත. අනික් අතට නිර්මාණ කරුවකුට මෙයින් කිසියම් එක් මගක පිහිටා කෘති රචනයට ඇති ඉඩකඩ ද හිමි විය යුතුය. නවකතාවක් හෝ අන් කවර සාහිත්‍ය කෘතියක් වුව පාඨකයා ධනාත්මක චින්තනය කරා යොමු කරවීම ලේඛකයකුගේ හෝ ලේඛිකාවකගේ අභිප්‍රාය විය හැකිය.

එවන් නවකතාවක් මෑතකදී ස්වරණකාන්ති රාජපක්ෂ විසින්, ප්‍රකාශයට පත් කරනු ලැබ ඇත. 'හිමකැට සෝපානය' නමින් නම් කර ඇති මෙම කෙටි නවකතාව ශ්‍රී ලාංකික තරුණියකගේ අනාගත සිහිනය සැබෑ වීමේ සාර්ථක ගමනක් පිළිබඳව කෙරෙන විවරණයකි. වර්තමාන ශ්‍රී ලංකාව තුළ පමණක් නොව වෙනත් ඇතැම් පෙරදිග රටවල ද කාන්තාවන් ආර්ථික අවශ්‍යතා උදෙසා රැකියා සොයා විදේශගත වීම බහුලව දැකගත හැකි ප්‍රවණතාවකි. එවන් කතුන් ඇතැම් විට සිය සිහිනය සැබෑ කරගැනීමට වාසනාවන්ත වන අතර ඇතැමුන් ඊට හාත්පසින්ම වෙනස් වූ ඉරණමකට ගොදුරු වන අයුරු ද අපට අසන්නට ලැබේ. මෙලෙසට රැකියා සොයා විදේශගත වන්නවුන් හැරුණ විට අධ්‍යාපනය සමග විවිධ වෘත්තීන් සඳහා සුදුසුකම් ලැබීමේ පරමාර්ථයෙන් විදෙස් රටවල ඇතැම් ආයතන කරා යන ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයේම අය ද වෙති.




'හිමකැට සෝපානය' නවකතාවේ කථා නායිකාව වන උමා, කතුවරිය පවසන පරිදිම, 'අනේක ස්වප්න පුෂ්ප පිදෙන තාරුණ්‍යයේදී එවන් සිහිනයක්' දෝතින් නෙළා ගන්නීය. මේ ගැන තව දුරටත් පවසන කතුවරිය, නවකතාවේ පෙරවදන ලෙස ගත හැකි ආරම්භක හැඳින්වීමෙහිදී, කතා සාරය පිළිබඳ ඉඟියක් පාඨකයාට ලබා දෙන්නට යොමු වී ඇත. "යුරෝපීය සිසිර කාලය සම්පූර්ණයෙන්ම බත්තරමුල්ලේ තමන් විසින් තනාගනු ලැබූ මෙම නව නිවසේ ගත කොට මාර්තු මාසය මැද පමණ වෙද්දී, අලුත් වසන්තය උදා වෙද්දී, පෙරළා ජර්මනියට යාමට උමා සහ ජෝ අදහස් කරගෙන සිටිති. ...... වසරින් සෑහෙන කාලයක් මව් රටේ ගත කිරීම වනාහි ගෙවී ගිය හතළිස් වසර පුරාම උමාගේ සිත්සතන් පුරා රජ කළ සිහිනයයි. දැන් ඒ සිහිනය සැබෑ වෙලාය. ඇත්ත වශයෙන්ම කල්පනා කර බැලුවොතින් දුක් මහන්සි වුවත්, අනේක පරිත්‍යාග කළත්, අවසානයේදී ජීවිතයේ තමන් අපේක්ෂා කළා වූ බොහෝ දෑ ලබාගන්නට ජන්ම වාසනාව ලද එකියකි. උමා .... (8, 9 පිටු)

උමා නම් වූ සාමාන්‍ය පවුලකට අයත් අහිංසක තරුණිය, වර්ෂ එක්දහස් නවසිය හැටපහේ සැප්තැම්බර් මස විසිවන දා කොළඹ වරායේ සිට 'හියුගෝ' නම් නෞකාවෙන් සිය අනාගතය කරා තනිවම ගමන් අරඹන ආකාරය නවකතාව ආරම්භයේදීම දැක්වෙයි. විශේෂයෙන්ම තරුණ හා යෞවන වියේ පසු වන පාඨකයන්ට, එයිනුදු වැඩි වශයෙන්ම ගැහැනු ළමයින්ට, කුතුහලයෙන් යුතුව කියවිය හැකි කථාන්තරයක ආරම්භය මෙලෙස සනිටුහන් වෙයි. සාමාන්‍ය පවුලක දෙමාපිය යුවළක් විසින් සිය දියණියගේ ආශාව ඉටු කරගැන්ම සඳහා ඇයගේ විසිඑක් වන උපන් දිනය වෙනුවෙන් පිරිනමනු ලබන මා හැඟි උපන් දින ත්‍යාගයක් ලෙස මෙම විදෙස් ගමන සංවිධානය කෙරෙයි. සිය දියණියගේ අභිප්‍රාය ලෙස ජර්මනියට ගොස් වැඩිදුර අධ්‍යාපනය ලැබීම වෙනුවෙන් තමන්ට දිය හැකි උපරිම සහයෝගය දෙන උමාගේ මව්පියන් පිළිබඳව නවකතාව ආරම්භයේදී කෙරෙන කෙටි සඳහනට පසුව කතාව දිග හැරෙන්නේ උමාගේ නෞකා ගමන හා ඉන් අනතුරුව පියාගේ මිතුරන් ආදීන්ගේ සහාය ලැබ ජර්මනියට ළඟා වන අයුරුත් එතැන් පටන් ජර්මනියේ ඇය ගත කරන ජීවිතයත් ගැන විස්තරාත්මක තොරතුරු සම්බන්ධ කරගනිමිනි.

ශ්‍රී ලාංකික පාඨකයින් අතර මෙබඳු හෝ මීට සමීප හෝ අවස්ථාවලට මුහුණ දී නොමැති අයට මෙහි දැක්වෙන තොරතුරු හා සිදුවීම් අලුත්ම අත්දැකීමක් වනු නොඅනුමානය. විදෙස් ගමන් සඳහා ගුවන් යානා මගින් එහා මෙහා යාම වර්තමානයේ වැඩි වශයෙන් ප්‍රචලිත වුවද සාගරය තරණය කරමින් කෙරෙන නැව් ගමන් ගැන අසන්නට ලැබෙනුයේ අල්ප වශයෙනි. එබැවින් මෙම නවකතාවේ කතුවරිය සිය කෘතියේ මුල පටන් උමාගේ සති තුනක මුහුදු ගමන ගත වන ආකාරය පිළිබඳ රසවත් සිදුවීම් මාලාවක් ඉදිරිපත් කර ඇත. නවකතාවේ එක් එක් පරිච්ඡේද වෙනත් වෙනත් නම්වලින් හඳුන්වන කතුවරිය, 'නිල් සයුර', රළ පෙරළිය', 'කේප් ටවුන්', 'ආකර්ෂණය', 'රැල්ල බිඳෙයි', 'දිය මත ඇඳි ඉරි', 'සේන්දු වුණෙමි' යනාදී වශයෙන් විවිධ වූත්, අන්තර්ගතයට අදාළ වූත් කෙටි මාතෘකා යොදාගෙන තිබීම ද වැදගත්ය.

දීර්ඝ හා වෙහෙසකර මුහුදු ගමනක නිමාව සටහන් කරමින්, නෞකාව, ප්‍රංශයේ 'මාසේ' වරායට සේන්දු වන අවස්ථාවේ නෞකාව තුළම සිදු වූ උත්කර්ෂවත් සිදුවීම් මෙන්ම අවට සුන්දර දර්ශනය ද කතුවරිය ඉතා රමණීය ලෙස ගෙන හැර දක්වන්නේ එම කෙටි සටහනට උචිත මැයක් වන 'සේන්දු වුණෙමි' යන්න ද යොදාගනිමින්ය. මෙම අවස්ථාවේ අවට දර්ශනය මෙන්ම නෞකාව තුළ සිදු වූ විසිතුරු දේ ද අගනා ලෙසත්, කාව්‍යමය ලෙසත් ගද්‍යයෙන් පවසන්නට ස්වර්ණකාන්ති රාජපක්ෂ සතු නිර්මාණ කුසලතාව බෙහෙවින් ඉවහල් වී ඇති බව පැහැදිලිය.

"සුවහසක් තරු කැට විසිරී තිබුණේ දුහුල්කඩ බඳු වලා පටල සහිත පසුතලයකය. ඒ මැදින් වටකුරු පැණිපාට ලොකු හඳක් පායා ආවේය ------. රෑ යාමය දැඩිව යද්දී සාගර ජලය කාල වර්ණ වී ගියත් ඒ මත වැගිරෙන සඳකැන් නිසා මගේ දෑසට හසු වූයේ රන් වැඩ දැමූ කලු සේද සේලයක් සුළඟේ ලෙළෙන පරිදිය ------. වාදක මණ්ඩලය දිලිසෙන ඇඳුම් ආයිත්තම්වලින් සැරසී සිය වාද්‍ය භාණ්ඩ සුසර කරමින් සිටියෝය ------. ෂැම්පේන් හා වයින් බෝතල් දුසිම් ගණනාවක් නැව් තට්ටුවේ පසෙකින් සුදුරෙදි අතුරා කදිමට සකස් කර තිබූ දිගටි මේස මතට වී පුලපුලා බලා සිටියේ හියුගෝ නෞකාව සති තුනක වෙහෙසකර චාරිකාව සම්පූර්ණ කොට මාසේ වරායට සේන්දු වීමේ උත්කර්ෂය කල එළියට ගෙන එන්නටය." (41 පිට)

අප්‍රාණික වස්තූන්ට ජීවය ආරෝපණය කරමින් මෙලෙසට සොඳුරු දසුනක් ලෙස එම අවස්ථාවේ විශේෂත්වය කලාත්මක ලෙස වර්ණනාත්මකව ගෙන එන්නට කතුවරිය සතු නිර්මාණ කුසලතාව බෙහෙවින් ඉවහල් වී ඇත.

'හියුගෝ' නෞකාව මෙලෙසට සති තුනක වෙහෙ-